# ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ආශ්‍රිත ජන කවි පුද්ගල ආකල්ප සංවර්ධනය උදෙසා යොදාගත හැකි අයුරු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ජයසේන එස්.ඩබ්ලිව්.ඒ.ආර්.**[1]

ප්‍රාථමික හෝ සංකීර්ණ බවට පත් ජන සමූහයක් අතර කාලයක් පුරාවට මුඛපරම්පරාගත සම්ප්‍රදායෙන් ව්‍යාප්ත වූ ඥාන සම්භාරය ජනශ්‍රැතියක් වේ. ජනශ්‍රැතියේ එක් අංගයක් වශයෙන් ජන කවිය හැඳින්විය හැකි ය. ජන කවිය මිනිසා සමඟ ඉතාමත් බද්ධ ජනශ්‍රැතික අංගයකි. මෙරට තුළ වාපි සංස්කෘතිය බිහිවීමත් සමඟ එදිනෙදා ජීවිතය ඒ හා බද්ධ විය. ඒත් සමඟ ම මෙරට තුළ කෘෂි සංස්කෘතිය වටා ගොඩනැංවුණු ජන සාහිත්‍යයක් ඇති අතර එයින් ජන කවි සුවිශේෂී වේ. මෙහි පර්යේෂණ ගැටළුව වන්නේ කෘෂිකර්මාන්තය ආශ්‍රය කරගනිමින් නිර්මිත ජන කවි තුළින් පුද්ගල ආකල්ප සංවර්ධනය උදෙසා කුමන දායකත්වයක් ලබා දෙන්නේ ද? යන්න වන අතර, මෙහි අධ්‍යයන අරමුණ වූයේ කෘෂිකර්මාන්තය පිළිබඳව සඳහන් වන ජන කවි තුළින් පුද්ගල ආකල්ප සංවර්ධනය උදෙසා ලබාගත හැකි පිටුබලයන් පිළිබඳව අධ්‍යයනය කිරීම යි. මෙම අධ්‍යයනයේ දී තොරතුරු එක්රැස් කරගැනීම සඳහා ක්ෂේත්‍ර හා ක්ෂේත්‍ර නොවන අධ්‍යයන යොදාගන්නා ලදී. ඈත අතීතයේ පටන් කෘෂිකර්මාන්තය ජන ජීවිතය හා සුවිශේෂී බද්ධ වීමක් සිදු ව ඇති අතර ඒ ආශ්‍රිත ව බිහි වූ ජනකවි ද පුද්ගලානුබද්ධ වී ඇත. මෙලෙස බිහි වූ ජන කවි තුළ ග්‍රාමීය ජන සමාජයන් පිළිබඳ පමණක් නොව ඔවුන්ගේ දෛනික ජීවිතයන් පිළිබඳව ද කරුණු අන්තර්ගතව පවතී. එමෙන් ම ජන කවිය සතු ව ඇති නිර්ව්‍යාජ බව මෙන් ම සරල භාෂාවත් සිත් ඇදගන්නා සුළු බවත් තුළින් ජන කවි පුද්ගල ආකල්පයන් හා සංයෝජනය වීමක් සිදු ව තිබේ. කෘෂිකාර්මික ජන ජීවිතයක් ගතකළ අප ආදීතමයෝ ඖෂධ වර්ග, කෙම් ක්‍රම, සිරිත් විරිත්, ආහාරපාන වර්ග පවා තවත් පරම්පරාවකට සන්නිවේදනය කරනු ලැබුවේ මුඛ පරම්පරාගතව ය. ස්වකීය රැකියා භූමිකා සිත් ඇඳගන්නා සුළු ව වර්ණනාත්මක ව ඉදිරිපත් කිරීම ඔස්සේ එකී රැකී රක්ෂා පිළිබඳව තම පිරිස අතර යහපත් ආකල්ප ඇති කිරීමට ඔවුන් ක්‍රියාකර ඇත. මෙම ජන කවි අධ්‍යයනයේ දී ජය පැරදුම, දරාගැනීමේ හැකියාව වර්ධනය කිරීම, සහයෝගය, සමගිය, කණ්ඩායම් සහයෝගය වර්ධනය, ප්‍රබෝධමත් බව යන සාධක ඔස්සේ පුද්ගල ආකල්පයන් සංවර්ධනය වී ඇත. සමස්තයක් වශයෙන් ගෙන සලකා බැලීමේ දී අපට නිගමනය කළ හැකිවන්නේ ආකල්ප සංවර්ධන ක්‍රියාවලිය උදෙසා කෘෂිකර්මාන්තය හා බැඳි ජන කවිය ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ක්‍රියාකර ඇති බව ය. එමෙන් ම හොඳ සහ නරක යන අන්ත දෙක කෙරෙහි ම ජනකවිය ඔස්සේ ආකල්ප හටගැන්වීම ක්‍රියාත්මක වී ඇති ආකාරයත්, ස්වකීය නිර්මාණශීලී සරල භාෂාව භාවිතයෙන් තත්කාලීන සමාජ සංස්ථාවේ පුද්ගල ආකල්ප සංවර්ධනය කිරීමට ජනකවිය සමත් වී ඇති බවත් මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වේ.

**මුඛ්‍ය පද** : කෘෂිකර්මාන්තය, ජන කවිය, ජන සමාජය, ආකල්ප සංවර්ධනය

[1]භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. ruwanmalianuradha@gmail.com